SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - (2025)
ஆண்டிறுதி மதிப்பீடு - (2025)
**Year End Evaluation - (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

**I කොටස** 10895

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. "මහණෙනි, මට හිත ඇති සෑම කෙනෙක් ම මෙම ධම්මාරාම තෙරුන් ආදර්ශයට ගත යුතුය. මල් සුවඳ ආදියෙන් මා පුදන්නේ නිසි ලෙස මා පුදන්නෝ නොවෙති. ධර්මානුකූල පිළිවෙත් පුරන්නෝ ම මා පුදන්නෝ වෙති." මෙම ප්‍රකාශයෙන් බුදුරජාණන් වහන්සේ උගන්වා ඇත්තේ කිනම් පූජාවක් උසස් වන බව ද?
    i. ආමිස පූජා ii. ප්‍රතිපත්ති පූජා iii. ස්තූප පූජා iv. කඨින චීවර පූජා

02. බුදුරජාණන් වහන්සේ දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය යන තුන් ලෝකයට ම ශ්‍රේෂ්ඨ නායකයෙකි. එම නායකත්වය උන්වහන්සේට ලැබුණේ,
    i. පරම්පරාවෙන් ය. ii. ජනතා ඡන්දයෙන් ය.
    iii. පිය උරුමයෙන් ය. iv. අධ්‍යාත්මික ශක්තියෙන් ය.

03. සංඝ රත්නය ලොව පහළ වූයේ සම්බුද්ධත්වයෙන් කොපමණ කාලයකට පසුව ද?
    i. තෙමසකට පසුව ය. ii. දෙමාසයකට පසුව ය.
    iii. සතර මසකට පසුව ය. iv. හය මාසයකට පසුව ය.

04. බුදුරජාණන් වහන්සේගේ ලලාට ධාතු නිදන් කොට සාදන ලද වෙහෙර වහන්සේ වන්නේ,
    i. මහියංගණය වෙහෙර වහන්සේ ය. ii. ථූපාරාම වෙහෙර වහන්සේ ය.
    iii. තිස්සමහාරාම වෙහෙර වහන්සේ ය. iv. සේරුවාවිල වෙහෙර වහන්සේ ය.

05. වප්මගුල් දින සිදුහත් කුමරු විසින් දඹ රුක් සෙවණේ පලඟ බැඳගෙන වඩන ලද්දේ,
    i. මෛත්‍රී භාවනාවයි. ii. ආනාපානසති භාවනාවයි.
    iii. පිළිකුල් භාවනාවයි. iv. බුද්ධානුස්සති භාවනාවයි.

06. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කිසියම් කාන්තාවක සසුන් ගතව විදසුන් වඩයි නම් ඇයට සෝවාන් ආදි මාර්ග ඵල ලබා ගත නොහැකි ද?" බුදුරජාණන් වහන්සේගෙන් මේ අයුරින් විමසා සිටියේ,
    i. මුගලන් තෙරුන් වහන්සේ ය. ii. රාහුල තෙරුන් වහන්සේ ය.
    iii. ආනන්ද තෙරුන් වහන්සේ ය. iv. උපාලි තෙරුන් වහන්සේ ය.

07. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන 'ධම්ම පදය' ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයෙහි කවර නම් නිකායට අයත් වන්නේ ද?
    i. දීඝ නිකායට ය. ii. සංයුක්ත නිකායට ය. iii. ඛුද්දක නිකායට ය. iv. අංගුත්තර නිකායට ය.

08. මිනිස් දිවිය උසස් කිරීමට මග පෙන්වන ඉගැන්වීම් රැසක් බුදු දහමේ ඇතුළත් ය. එයින් දෙමාපියන් 'මහා බ්‍රහ්මයාට' උපමා කොට ඇත්තේ,
    i. සතර සංග්‍රහ වස්තූන්වල ය. ii. චතු අප්පමඤ්ඤාවල ය.
    iii. පන්සිල්වල ය. iv. සතර සම්‍යක් ප්‍රධානවල ය.



For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

09. බුදුරජාණන් වහන්සේ දසරාජ ධර්මයන් දේශනා කළේ,
i. භික්ෂූන් වහන්සේලාට ය. ii. භික්ෂුණීන් වහන්සේලාට ය.
iii. රාජ්‍ය පාලකයන්ට ය. iv. මහජනතාවට ය.

10. යම් ආයතනයක ඉහළ ඵලදායිතාවක් සඳහා සුහද සබඳතාවක් අවශ්‍ය ය. ඒ අනුව සේව්‍යයා විසින් සේවකයාත් සේවකයා විසින් සේව්‍යයාත් ඇගයීමට පොළඹවන බෞද්ධ ඉගැන්වීමක් සඳහන් වන සූත්‍රය වන්නේ,
i. මහා මංගල සූත්‍රය ii. රතන සූත්‍රය iii. සිගාලෝවාද සූත්‍රය iv. කාලාම සූත්‍රය

11. බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහානායක හාමුදුරුවන් විසින් රචිත ග්‍රන්ථය වන්නේ,
i. සාරාර්ථ සංග්‍රහයයි. ii. සිද්ධාර්ථ ශාක්‍ය මුනීන්ද්‍රාවදානයයි.
iii. මුණිගුණ අලංකාරයයි. iv. ධර්ම විනිශ්චයයි.

12. අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීම දියුණුවට හේතුවන මංගල කරුණක් ලෙස දක්වා ඇති සූත්‍රය වන්නේ,
i. දම්සක් පැවතුම් සූත්‍රය ii. රතන සූත්‍රය iii. මහා මංගල සූත්‍රය iv. කරණීය මෙත්ත සූත්‍රය

13. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ජාතික, ආගමික, සංස්කෘතික හා සාමාජික නවෝදයක් ලක්දිව ඇති වූයේ ය. එහි අධ්‍යාත්මික සමෘද්ධියේ හෙවත් නිර්වාණ මාර්ගයේ සංකේතය වූයේ,
i. බුද්ධ ප්‍රතිමාව යි. ii. බෝධීන් වහන්සේ යි. iii. ස්තූපය යි. iv. බුද්ධ මන්දිරය යි.

14. දුකට මුල් වන්නා වූ තෘෂ්ණාව මුළුමනින් ම නැසීමක් වේද, අත් හැරීමක් වේද, දුරලීමක් වේද, එහි නොඇලීමක් වේද එය හඳුන්වන ආර්ය සත්‍යය වන්නේ,
i. දුක්ඛ ආර්ය සත්‍යයයි. ii. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි
iii. දුක්ඛ සමුදයාර්ය සත්‍යයයි iv. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයයි.

15. මුල හොඳට ඇති කල - කැපූ ගස ලියලන සේ
දුරු නොකළ කල තණ්හා - පුන පුනා දුක උපදී ..... මෙම කවිය අනුව දුක හට ගැනීම නැති වන්නේ,
i. මෛත්‍රිය දුරු කළ විට ය. ii. තණ්හාව දුරු කළ විට ය.
iii. කරුණාව දුරු කළ විට ය. iv. මුදිතාව දුරු කළ විට ය.

16. ත්‍රිශික්ෂාවට අයත් පඤ්ඤා ශික්ෂාවේ අන්තර්ගත මාර්ගාංග දෙක වන්නේ,
i. සම්මා වාචා, සම්මා කම්මන්ත ii. සම්මා වායාම, සම්මා සති
iii. සම්මා සමාධි, සම්මා ආජීව iv. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප

17. බෞද්ධ ඉගැන්වීමට අනුව කුසලාකුසල කර්ම විනිශ්චය කිරීමේ හැකියාව පුද්ගලයාට ඇත. කර්ම විනිශ්චය කිරීමට අදාළ මිනුම් දඬු විවිධාකාර ය. බුදු දහමට අනුව ප්‍රධාන මිනුම් දඬුව වන්නේ,
i. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාව යි. ii. පන්සිල් ය. iii. අකුසල ක්‍රියාව යි. iv. චේතනාව හා විපාකය යි.

18. **'ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති'** මෙම පටිච්ච සමුප්පාද දේශනාවේ අර්ථය වන්නේ,
i. මෙය ඇති කල්හි මෙය වේ. ii. මෙය හට ගැනීමෙන් මෙය හටගනී
iii. මෙය නැති කල්හි මෙය නොවේ. iv. මෙය නැතිව යාමෙන් මෙය නැතිව යයි.

19. බෞද්ධ සූත්‍ර දේශනාවල බ්‍රාහ්මණ යාගය ප්‍රතික්ෂේප කොට තිබේ. යාගය වෙනුවට බුදු දහම ආදේශ කරන්නේ,
i. ප්‍රිය වචනයයි. ii. සමානාත්මතාව යි. iii. දානයයි. iv. අර්ථචර්යාවයි.

20. දෙවන ධර්ම සංගායනාවට අදාලව තොරතුරු සඳහන් වන නිවැරදි පිළිතුර වන්නේ,
i. සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය, වාලුකාරාමය, අජාසත් රජතුමා
ii. වජ්ජිපුත්තක භික්ෂුවගේ විනය විරෝධී දස වස්තුව, වාලුකාරාමය, කාලාශෝක රජතුමා
iii. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් මිථ්‍යා ලබ්ධික පිරිස් භික්ෂු වෙස්ගැන්වීම, අශෝකාරාමය, ධර්මාශෝක රජතුමා
iv. වජ්ජිපුත්තක භික්ෂූන්ගේ විනය විරෝධී දස වස්තුව, වාලුකාරාමය, ධර්මාශෝක රජතුමා

(ලකුණු 2 x 20 = 40)



For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01. ඔබ දෙවන වාරයට නියමිත පාසල් පාදක ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ පන්ති කාමරයේ දී සිදු කළ ඇගයීම කුමක් ද? ඊට පාදක කරගත් පාඩමේ නම කුමක් ද?
ii. ඇගයීම සිදු කිරීමේ දී විෂය භාර ගුරුභවතාගෙන් ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න.
iii. ඇගයීමට පාදක වූ පාඩම තුළින් ඔබේ දිවියට ලැබුණු වටිනාකම් **දෙකක්** ලියන්න.
iv. ඇගයීම සිදු කිරීමේ දී ඔබට ඇතිවූ ගැටලු **දෙකක්** ලියන්න.
v. ස්තූපයේ ආකෘතියට අනුව බුබ්බුලාකාර හා ඝටාකාර ස්තූප දෙක පිළිබඳ හැඳින්වීමක් කරන්න.
vi. අනුරාධපුර යුගයට අයත් බෞද්ධ චිත්‍ර පිහිටා ඇති ස්ථාන **දෙකක්** නම් කරන්න.
vii. දඹදෙණි යුගයට අයත් සද්ධර්මරත්නාවලිය රචනා කළ කතුවරයා කවුරුන් ද?
viii. සීගිරි ගී නිර්මාණ අයත් සාහිත්‍ය යුගය කුමක් ද?
ix. කෝට්ටේ සාහිත්‍ය යුගයට අයත් ලෝවැඩ සඟරාව හා බුදුගුණාලංකාරය යන කාව්‍ය ග්‍රන්ථ රචනා කරන ලද කතුවරයා කවරෙක් ද?
x. ස්වර්ණභූමියට බුදුදහම රැගෙනයාමට ප්‍රධානත්වයගත් මහරහතන්වහන්සේ නම් කරන්න.

(2 x 10 = 20)

02. i. 'සීලය' යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 02)
ii. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය ලියා දක්වන්න. (ලකුණු 03)
iii. යහපත් සමාජයක් නිර්මාණය කිරීමට බෞද්ධ සීල ප්‍රතිපදාව උපයෝගී වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

03. i. සිව්වනක් පිරිස නම් කරන්න. (ලකුණු 02)
ii. සිගාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන්ගෙන් ගිහියාට ඉටු විය යුතු යුතුකම් 03 ක් ලියන්න. (ලකුණු 03)
iii. ගිහි පැවිදි යුතුකම් මැනවින් ඉටු කිරීම තුළින් දෙපිරිසට ම සිදුවන යහපත පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. i. ශ්‍රී ලාංකික බෞද්ධ සමාජ, ආර්ථික ක්‍රමයේ බෞද්ධ මුහුණුවර ප්‍රකට කෙරෙන ජනප්‍රිය ව්‍යවහාරය නම් කරන්න. (ලකුණු 02)
ii. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස අපට ලැබුණු දායාදයන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
iii. ශ්‍රී ලාංකේය බෞද්ධ ජන සමාජයේ දියුණුව උදෙසා මහින්දාගමනයෙන් හා දුමින්දාගමනයෙන් ලැබුණු දායකත්වය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 05)

05. i. **'නිබ්බාන පරමං සුඛං'** යන්නෙහි තේරුම ලියන්න. (ලකුණු 02)
ii. පහත දැක්වෙන දහම් පදවල අර්ථය දක්වන්න.
සන්තුස්සකෝ ..........................................................
සුභරෝ ..........................................................
සන්තින්ද්‍රියෝ .......................................................... (ලකුණු 03)
iii. අල්පේච්ඡ සරල දිවියකට හුරු වීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

06. i. නිවන් මගෙහි බීජය ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියා දක්වන්න. (ලකුණු 02)

ii. ඉන් එකක් හඳුන්වන්න. (ලකුණු 03)

iii. ඔබ ශ්‍රද්ධාවෙන් කටයුතු කළ අවස්ථාවක් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) කෙටි සටහන් ලියන්න.

i. භද්දකච්චානා තෙරණිය

ii. සම්මා කම්මන්ත

iii. බෞද්ධ කලාව

iv. නිරෝගීකම (5 x 2 = 10)



For Educational Purpose Only

SLGURU.LK